# මනස, මොළය සහ හෘද වස්තුව

වෛද්‍ය චන්න සුදත් ජයසුමන

මනස සහ එහි පැවැත්ම පිළිබඳ ව දීර්ඝ කාලයක් පුරා බොහෝ දාර්ශනිකයන් හා විද්‍යාඥයන් විවිධ මත පළ කර ඇත. ඒ අතුරින් බටහිර දාර්ශනිකයන් හා විද්‍යාඥයන් භෞතිකවාදී හෝ විඥානවාදී පදනමක සිට මනස පිළිබඳ අර්ථකතන ලබා දී ඇත. භෞතිකවාදීන් ට අනුව මනස යනු ද්‍රව්‍යයන්ගෙන් නිර්මාණය වන දෙයකි. ඒ අනුව ද්‍රව්‍ය ප්‍රධාන වේ. දාර්ශනික ගුරුකුලයට අනුව විවිධ දිශා ඔස්සේ මත පළ කළ ද මේ වන විටත් බටහිර ප්‍රමුඛ මතය වන්නේ මනස මොළයේ භෞතික ක්‍රියාකාරීත්වය නිසා ඇතිවන්නක් බව යි. බටහිර චින්තනයට අනුව අනෙක් ආකල්පය එහි විරුද්ධය වෙයි. එනම් මනස ප්‍රධාන වන අතර ද්‍රව්‍ය යනු මනසේ නිර්මාණ වෙයි. එය විඥානවාදී මතය ලෙස හැඳින්වේ. ඒ අනුව මනස යනුවෙන් යමක් පවතීයැයි ඔවුහු විස්තර කරති.

බටහිර දාර්ශනිකයන් හා විද්‍යාඥයන් මනස පිළිබඳ ව මේ ආකාරයේ මත පළ කරද්දී ඊට බොහෝ කාලයකට පෙර සිට පෙරදිග දාර්ශනිකයන් හා විද්‍යාඥයන් ඒ පිළිබඳ අවධානය යොමු කර ඇත. බුදු රජාණන් වහන්සේ තරම් මනස පිළිබඳ දේශනා කළ දාර්ශනිකයෙක් තවත් නැත. බෞද්ධ, වෛදික, ජෛන හා හින්දු දාර්ශනිකයන්ගේ ජනප්‍රියත ම හා වැදගත් ම සංවාද මාතෘකාව වූයේ මනස ය. මනස පිළිබඳ සංවාද නිසාම විවිධ බෞද්ධ ගුරුකුල බිහි විය. ථේරවාදීන්ට මනස ගැන අගනා පැහැදිලි කිරීමක් විය. මහා විහාර සම්ප්‍රදායේ කැණිමඩල මනස පිළිබඳ මේ පැහැදිලි කිරීම හා බැඳී තිබිණි යැ යි සැලකිය හැක. නමුත් අනුරාධපුර යුගය මැද අවධියේ සිට මේ පැහැදිලි කිරීම් හා ඒවාට නව අර්ථකතන සැපයීම් ප්‍රමාණවත් ව සිදු නොවීම නිසා ථෙරවාදීන් සතු වූ ඒ අගනා දැනුම වැළලී ගිය බව විශ්වාස කළ හැක. කලින් කලට ඒ ඒ සංස්කෘතීන්ගේ දැනුමේ අවශ්‍යතා ද වෙනස් වේ. ඒ අනුව නව

---

**දැක්ම** - 02, (මහාචාර්ය ආර්.ඩී.ගුණරත්න උපහාර කලාපය), (සංස්. වීරවර්ධන; සුමේධ) සංස්කාරකගේ ප්‍රකාශනයකි; මහනුවර, 2008, 135-149 පිටු.

දැනුම සැපයීමක් සිදු නොවුව හොත් සිදු වන්නේ වෙනත් සංස්කෘතියක නිර්මාණය කළ දැනුමක් ඒ අවශ්‍යතාවය උදෙසා යොදා ගැනීමට ය.

අප දැන් මේ උත්සාහ කරන්නේ මනස යනු කුමක් ද ? එය කුමක් ඇසුරු කරගෙන පවතී ද? යන වග ථේරවාදී බෞද්ධ පදනමක සිට විවරණය කිරීමටයි. මේ අයුරින් කතා කළ ද ඉන් අප අදහස් කරන්නේ මනසක් යනුවෙන් දෙයක් පවතින බව නො වේ. මේ කතා කරන්නේ නැති මනසක් පිළිබඳ ව යි. එහිදී ථෙරවාදී අභිධර්ම පිටකයෙන් ලැබුණු ආභාෂය අතිශයින් වැදගත් විය. බෞද්ධ ගුරුකුලයන් අතර අභිධර්මය හා අභිධර්ම පිටකය පිළිබඳ විවිධ මතභේද පවතී. ඒ කෙසේ වුවත් අපට වැදගත් වූයේ මහා විහාරික සම්ප්‍රදායෙන් උරුම වූ ආභිධාර්මික ඉදිරිපත් කිරීම් ය. මීට අමතර ව සර්වස්තිවාදීන්, වාත්සී පුත්‍රියයන්, ධර්මගුප්ත නිකායිකයන්, බහුශ්‍රැතික නිකායිකයන් හා යෝගාචාර වැනි මහායාන නිකායිකයින් අභිධර්මය ගැන මතිමතාන්තර පළ කර ඇත. නමුත් ඒවා මෙහිදී එතරම් වැදගත් නොවී ය.

මෙහි දැක්වෙන විස්තර කිරීම්වලට අනුව මනස යනු මොළයේ හෝ වෙනත් අවයවයක ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් නො වේ. එනම් මනස යන්න කිසිදු අරුතකින් භෞතික පැවැත්මක් ඇති දෙයක් නො වේ. එයට ඉතා සියුම් අංශුමය හෝ විද්‍යුත් චුම්බක තරංගමය හෝ ගුණයක් නැත. ඒ අනුව මෙය භෞතිකවාදී විවරණයක් නොවේ. තව ද මෙහිදී කිසිදු අයුරකින් මනසක පැවැත්ම පිළි නොගනී. එය කුමන හෝ ආකාරයේ මූල හේතුවක් ද නොවේ. ඒ නිසා මෙය විඥානවාදී විවරණයක් ද නො වේ.

අපේ ප්‍රවාදයට අනුව මනසක් ඇත්තේ මිනිසුන්ට පමණක් නො වේ. තිරිසනුන්, දෙවියන් හා බ්‍රහ්මයන්ට ද මනසක් ඇත. නමුත් කාමාවචර සතුන්ගේ මනස පවතින්නේ යම් යම් අවයවයන් ඇසුරු කරගෙන ය. මළ මිනිසුන්ට ද ජරාජීර්ණ වීමට ප්‍රථම අවයව ඇත. නමුත් අපි ඒවාට මළ අවයව යැයි පවසමු. එසේ නම් ඒවා නොමළ අවයව යනුවෙන් හඳුන්වන්නේ කුමන ආකාරයෙන් පවතින

විට ද ? අපි උදාහරණයක් ලෙස මිනිස් සම සලකමු. සමට රුධිර සැපයුම හා ස්නායු සැපයුම හොඳින් ඇත්නම් සෛල සාමාන්‍ය පරිදි පරිවෘත්තීය ක්‍රියාවන්හි නිරත වන්නේ නම් එය නො මළ සමක් ලෙස සැලකිය හැකි ද ? අපේ සම ජීවී බව අප දැන ගන්නේ කෙසේ ද? සමට ඉදිකටුවකින් ඇන්නා යයි සිතමු. එවිට ඒ සංවේදනය අපට දැනේ. එවිට සම ක්‍රියාකාරී බව අපි අවබෝධ කර ගන්නෙමු.ඒ සංවේදනය අප ලබා ගන්නේ කොතැනකට ද ? බටහිර විද්‍යාඥයන්ට අනුව නම් ඒ සංවේදනය ස්නායු සෛල ඔස්සේ මොළයට ගමන් කර මොළයේ අදාල ප්‍රදේශයෙන් එය හඳුනා ගැනීම නිසා අපට සංවේදනය ලැබේ. ඒ අනුව ඊට අදාළ සිතුවිලි පහළ වන්නේ මොළයේ ය. සංකීර්ණ විද්‍යුත් හා රසායනික ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස එය සිදුවන්නේ යැ යි ඔවුහු පවසති. එනම් සම නම් ඉන්ද්‍රියයේත්, මොළයේත්, ඒවා සම්බන්ධ කළ ස්නායුන්ගේත් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස අපට ඉදිකට්ටෙන් ඇනීම පිළිබඳ විඥානය පහළ විය.

නමුත් අප පවසන්නේ සම යනු අවයවයක් පමණක් බවත් සම ඉන්ද්‍රියයක් වන්නේ මනස ඇත්නම් පමණක් බවත් ය. සම නම් අවයවයේ මනා ක්‍රියාකාරිත්වයට එනම් අදාළ සංවේදනය ලබා ගැනීමට සම, ස්නායු හා මොළය හොඳින් ක්‍රියා කළ යුතු ය. එවැනි නිරෝගී සමකට පමණි සංවේදන ලබා ගත හැක්කේ. එසේ සංවේදනය ලබා ගැනීමත් සමගම ඊට අදාල විඤ්ඤාණය එම ස්ථානයේ ම පහළ වේ. එසේ නොමැති ව එය පහළ වන්නේ මොළයේ නො වේ. එනම් ඉදිකට්ටෙන් ඇනීම පිළිබඳ සිත ඒ ඇන්න ස්ථානයේ ම ඇති වේ. දැනීම නො වී ගැටීම නො විය හැක. ගැටීම නොවී දැනීම නො විය හැකි ය. ඒ දෙකම එකවර සිදු වේ. වෙන් වෙන්ව සිදු නො වේ.

සිත් යන්න චිත්ත, විඤ්ඤාණ, මානස, හදය යනුවෙන් ද හඳුන්වයි. මනසට ගත හැකි කුඩාම කාල පරිච්ඡේදයේ වෙනත් ඉන්ද්‍රියයක් නොමැති ව නිර්මාණය කරන ධර්මය චිත්තය ලෙස සැලකිය හැකි ය. චිත්තයක් උපදිනා කාලය, පවතින කාලය හා බිඳෙන කාලය යනුවෙන් කාල තුනක් ඇත. මේ තුන් කාලය එක්

වූ විට චිත්තක්ෂණයක් ලැබේ. සාමාන්‍ය මිනිසකුගේ මනසට ගත හැකි කුඩාම කාලය චිත්තක්ෂණයක් ලෙස සැලකිය හැක. එක් චිත්තයක් නැති වන්නේ තවත් චිත්තයක් ඇති කරමිනි. ඒ අතර පරතරයක් නැත. පෙර චිත්තය පසු චිත්තයට තමන් සතු තොරතුරු ලබා දෙයි. දැන් මේ චිත්තය පෙර මෙන්ම නව තොරතුරු එකතු කර හෝ නැති කර ඊළඟ චිත්තයට තොරතුරු ලබා දී නැතිව යයි. නමුත් චිත්තයකට තොරතුරු ගබඩා කිරීමට කිසිදු භෞතික අවයවයක් අවශ්‍ය නො වේ. චිත්තයක් යනු අරූපාවචර දෙයකි.

මනස යනු ඒ ආකාරයේ චිත්ත පහළ වීම නිසා ඇති වන ප්‍රතිඵලයකි. ඒ ආකාරයේ චිත්ත පහළ නොවන්නේ නම් අපට ඉදිකටුවෙන් ඇනීම නො දැනේ. එසේ චිත්ත පහළ නො වේ නම් සම ඉන්ද්‍රියයක් බවට පත් නොවේ. සම නම් අවයවය ඉන්ද්‍රියයක් බවට පත් වුයේ චිත්ත පහල වීම නිසා ය. එනම් ඉදිකටුවෙන් ඇනීම දැනුනේ මනසට ය. අපට සෘජුව ම දැනෙන ඉන්ද්‍රියය මනස යි. යමකු ඇසීමට ඉඩ ඇත්තේ දෘෂ්ටි ස්නායුව ආබාධයකට ලක් වුවහොත් හෝ මොළයේ පෙනීමට අදාළ යැයි බටහිර විද්‍යාඥයන් පවසන ප්‍රදේශය අනතුරට පත් වුව හොත් හෝ පෙනීම නො ලැබී යනවා නොවේ ද යනුවෙනි. සැබෑ ය. එවිට ඇස සාමාන්‍ය ඇසක් නො වේ. එනම් සාමාන්‍ය පරිදි සංවේදනය ලබා ගැනීමට එයට නො හැකි වේ. ඒ නිසා පෙනීම පිළිබඳව සිත් පහළ නො වේ.

මනස යනු අඛන්ඩ සිතුවිලි පරම්පරාවකි. එසේ නම් මේ සිත් පහළ වන්නේ ඇස, කණ, නාසය, දිව, ශරීරය යන ස්ථානයන් අසුරු කර ගෙන පමණ ද ? යමකුට සතුට දැනෙන්නේ කුමන අවයවය ඇසුරු කරගෙන ද ? දුක දැනෙන්නේ කුමන අවයවය අසුරු කරගෙන ද ? කාමාවචර සතුන්ගේ මනස යනු මේ පංචේන්ද්‍රියයන් අසුරු කරගෙන පහළ වන සිත්හි එකතුවක් පමණක් ද ? නැත. ඉතා පැහැදිලිව ම නැත. මේ පංචේන්ද්‍රියයන් අසුරු කර නො ගෙන ද සිත් පහළ වේ.

සත්වයකුගේ මේ භවය සැලකු විට මුලින් ම උපදින සිත ප්‍රතිසන්ධි චිත්තයයි. එය ඉපැදී පැවතී නැති ව යයි. ඒ හා සමඟම

ඊළඟ සිත උපදී. මෙලෙස චුති චිත්තය පහල වන තුරුම අඛන්ඩ සිත් පරම්පරාවක් එකිනෙක සම්බන්ධ වේ. ඒ අතර මදකුදු හෝ හිඩැසක් නැත. අනෙක් වැදගත්ම කරුණ එකවිට සිත් දෙකක් පහළ නො වන බවයි. එසේ නම් මේ ප්‍රතිසන්ධි චිත්තය කාමාවචර සතුන්ගේ පහළ වන්නේ කුමක් ඇසුරු කරගෙන විය හැකි ද ?

පුරුෂ ශුක්‍රානුවක් හා ස්ත්‍රී ඩිම්බයක් සංසේචනය වී යුක්තානුවක් සෑදේ. ඉන් පසු සෛල විභාජනය වෙමින් නව සෛල තනා ගනිමින් සෛල 2, 4, 8 අවස්ථා පසු කරමින් මොරුලා අවස්ථාවට එළැඹේ. ඉන් පසුව එළැඹෙන 'බ්ලාස්ටොසිස්ට්' අවස්ථාවේ දී කළලය මවගේ ගර්භාෂයේ තැන්පත් වේ. සෛල විභාජනය වෙමින් ඒවා විශේෂිත පටක බවට පත් වෙමින් කළලයට සති 8ක් පමණ ගත වන විට අවයව ජනනය අවසන් වේ. කළලයේ ක්‍රියාකාරී වන පළමු අවයවය හෘදය යි. සිරුරේ අනෙකුත් සියළු අවයවයන්ට පෙර හෘදය ක්‍රියාකාරී වන බව බටහිර කළල විද්‍යාඥයන් නිරීක්ෂණය කර ඇත. සංසේචනයෙන් පසු 22 වැනි දින තරම් ප්‍රාථමික අවධියේ දී හෘදයේ ක්‍රියාකාරිත්වය අරඹන බව පෙනී ගොස් ඇත. ඒ වන විට මොළය ඇතුළු ස්නායු පද්ධතිය කිසිසේත් ක්‍රියාකාරී නැත. ඉන් පැහැදිලි වන්නේ හෘදයේ ක්‍රියාකාරිත්වය එයට තනිව ම ඇරඹිය හැකි බවයි. ආරම්භයේ දී එයට ස්නායු පද්ධතියේ බල පෑමක් නැත. පසු අවධියේ දී වුව ද ස්නායු පද්ධතිය මගින් සිදු කරනුයේ හෘද ස්පන්දනයේ වේගය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගෙන යාම සඳහා උපකාර කිරීමක් පමණි. එනම් හෘදයට තනිව ම ක්‍රියා කිරීමේ හැකියාවක් ඇත.

ථේරවාදී අභිධර්මයෙන් ලැබුණු ආභාෂය මත පදනම් වී අපට පැවසිය හැක්කේ ප්‍රතිසන්ධි චිත්තය හා හෘදය අතර යම් සබැඳියාවක් ඇති බවයි. නමුත් එය හුදු හෘදයේ භෞතික පැවැත්මකට ඌනනය කිරීමක් මෙහිදී සිදු නොවේ. ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පංචේද්‍රියන් ඇසුරු කර ගෙන පහල වන සිත් හැරුණු විට ප්‍රතිසන්ධි චිත්තය හා අනෙකුත් සියළු ම ප්‍රධාන සිත් ඉපැදීම **හෘද වස්තුව** ඇසුරු කර ගෙන සිදු වේ. පෘතග්ජන සත්ත්වයකුගේ සිත් පහළ වන්නේ මේ ස්ථාන හය ඇසුරු කරගෙන නම් මොළය

ඇසුරු කරගෙන සිත් පහළ නො වන්නේ ද යන්න යමෙකුට ඇති විය හැකි ගැටලුවකි. අප පවසන්නේ මොළය යනු ආධාරක අවයවයක් මිස සිත් ඇති විය හැකි ස්ථානයක් නො වන බවයි. චිත්ත පහළ වීමට ආධාර විය හැකි ස්ථාන හා එසේ ආධාර නො වන ස්ථාන තීරණය වන්නේ ඒ ඒ අවයවවල රූප කළාපයන්ගේ ස්වභාවය අනුව ය. මොළයේ රූප කළාප සිත් පහළ කර ගැනීමට රුකුල් නො දෙන ලෙස සැලකිය හැකි ය.

**මේ හෘද වස්තුව යනු කුමක් ද? හෘදය ද ? නැත එය හෘදය යනුවෙන් හඳුන්වන අවයවය නොවේ. අපේ භාෂාවේ හෘද වස්තුව හා හෘදය යනුවෙන් පැහැදිලි වචන 2 ක් ඇත. ථෙරවාදී මහාවිහාරික සම්ප්‍රදායෙහි ඇති අභිධර්ම කෘති හතෙන් හත්වැන්න එනම් පට්ඨානප්පකරණයේ ''වත්ථුරූපය'' යන නමින් මේ පිළිබඳ සාකච්ඡා වේ. බුද්ධ කාලීන දඹදිව හෘද වස්තුව හා මනස පිළිබද යම් යම් අදහස් පැවතිය ද බුදුරජාණන් වහන්සේ ඒ පිළිබඳව සවිස්තර ව දේශනා කළ වගක් සූත්‍ර, විනය පිටක තුළින් සොයා ගත නොහැක.**

මීට සමාන අදහසක් ආයුර්වේදයේ ද ඇතැම් තැන්හි සඳහන් වේ. චරක සංහිතාවේ 'අර්ථෛද්වාදශමමමහාමූලිය අධ්‍යය' හි **'බ්‍රහ්ම හෘදය'** යනුවෙන් හෘද වස්තුවට සමාන අරුතක් දෙන්නක් පිළිබඳ සාකච්ඡා වේ. හෘදයෙහි රුධිර ධාතුව ඇසුරු කොට පවතින බ්‍රහ්ම හෘදයට සම්බන්ධව අනෙකුත් ඉන්ද්‍රියයන් විඥාන පහල කර ගන්නා බවත්, එය පරාලවලට යට ලීය ආධාරක වන අයුරට සමාන වන බවත් එහි සඳහන් වේ.

හෘද වස්තුව යම් සලකන මොහොතක හෘදයේ පවතින රුධිරය නිසා ඇති වන්නකි. හෘදය තුළින් රුධිරය සංසරණය වීම නිසා එය ඊළග ක්ෂණයේ දී වෙනස් වේ. නිශ්චිතව පවතින රුධිරය යැයි, පැවසිය හැකි දෙයක් හෘදය තුල නොපවතියි. නිරෝගී මිනිසකුගේ හෘද ස්පන්දනය මිනිත්තුවට 72 වාරයක් පමණ වේ. සෑම හෘද ස්පන්දනයක් සමගම එක් එක් කෝෂිකාවෙන් 70ml පමණ ප්‍රමාණයක් බැගින් රුධිරය හෘදයෙන් ඉවතට පොම්ප කරයි. එනම්

හෘදයේ ඇති රුධිරය සැනෙකින් වෙනස් වේ. රුධිරය එසේ පොම්ප කළ ද හැම මොහොතකම හෘදය තුළ රුධිර ප්‍රමාණයක් පවතියි. නමුත් හෘද වස්තුව යනු රුධිරය ද නොවේ. පංචේන්ද්‍රියයන් ඇසුරු කරගෙන උපදින චිත්තයන් හැරුණු විට කාමාවචර සතුන්ගේ අනෙකුත් චිත්ත උපදින්නේ මේ හෘද වස්තුව ඇසුරු කරගෙන ය. ඇස, කණ, නාසය, දිව, ශරීරය යන අවයවයන් හා හෘද වස්තුව ඇසුරු කර ගෙන චිත්තයන් ඇති වේ යැයි සඳහන් කළ ද චිත්තයන් සිරුර තුළ සිරවී ඇතැයි ඉන් අදහස් නො වේ. මේ අවයවයන් හා හෘද වස්තුව අවශ්‍ය වනුයේ මනස එතරම් දියුණු නැති කාමවචර සතුන්ගේ චිත්ත ඇති වීමට ආධාරකයක් ලෙස පමණි.

මෙහිදී අවධාරණය කළ යුතු වැදගත්ම කරුණක් නම් මිනිසුන්ගේ හා තිරිසනුන්ගේ චිත්තයන් ඇති වීම සඳහා හෘද වස්තුව ආධාරකයක් පමණක් බවයි. එසේ නො මැතිව එය මූල හේතුවක් නො වේ. චිත්ත ඇති වීමට කර්ම ශක්තීන් හා තවත් බොහෝ සාධක බලපාන බව සිතිය හැක. එනම් මිනිසුන්ගේ හා තිරිසනුන්ගේ චිත්තයන් හෘද වස්තුව ඇසුරු කරගෙන පහල වුවද හෘදයක් තුළින් රුධිරය ගලා යන සෑම විටම චිත්තයන් උපදියැයි ගැනීම වැරදි ය.

දැන් අපි යම් සංවේදනයක් අපට ලැබෙන අයුරු මදක් විස්තරාත්මක ව විමසා බලමු. එහිදී **'චිත්ත වීථි'** ගැන යම් අවබෝධයක් ලබා තිබීම වැදගත් ය. සාමාන්‍යයෙන් චිත්ත වීථියක් සමන්විත වනුයේ චිත්තක්ෂණ 17 කිනි. පංචේන්ද්‍රියයන් හා බැඳුණු අරමුණක් පදනම් කරගෙන ඇති වන චිත්ත විථි හා එසේ පංචේන්ද්‍රියයන් හා බැඳුණු අරමුණකින් තොර ව ඇතිවන චිත්ත වීථි ලෙස ප්‍රධාන කොටම චිත්ත වීථි දෙයාකාර ය. (පිළිවෙළින් පඤ්චද්වාරික වීථි හා මනෝද්වාරික වීථි ලෙස අභිධර්මයේ මේවා දක්වා ඇත.)

දැන් අපි එක් නිරීක්ෂකයකු විසින් පැන්සලක් ලෙස නිර්මාණය කර ගත්තක් තවත් නිරීක්ෂයකු විසින් ග්‍රහණය කර ගන්නේ කෙසේ දැ යි චිත්ත වීථිය ඇසුරින් තේරුම් ගැනීමට උත්සාහ දරමු. චිත්ත වීථියේ පළමු චිත්තක්ෂණ 4 හෘද වස්තුව ඇසුරු කර ගෙන

ඇති වේ. ඇස අරමුණක් කරා යොමු කිරීමේ සූදානමක් එහිදී ඇති කරන්නේ යැ යි සැලකිය හැක. පැහැදිලි කිරීම සඳහා මේ අයුරින් ප්‍රකාශ කළ ද ගැටීම හා දැනීම යනු අවස්ථා දෙකක දී සිදුවන දෙයක් නො වේ. එය එක් විටම සිදු වේ.

මෙහි පළමු චිත්තය භවාංග චිත්තය ලෙස හඳුන්වයි. මූල චිත්තය හා ප්‍රකෘති චිත්තය ලෙස හඳුන්වන්නේ ද එයම ය. සාමාන්‍යයෙන් චිත්ත වීථියක පළමු චිත්තය භවාංග චිත්තය ලෙස සලකයි. නමුත් සියළු භවාංග චිත්ත එක හා සමාන යැ යි වැරදියට ගත යුතු නැත. එක් භවාංග චිත්තයක් තවත් භවාංග චිත්තයකින් වෙනස් වේ. පසුගිය භවයේ අවසානයට ඇති වූ චුති චිත්තයටත් මේ භවයේ පළමුව ඇති වූ ප්‍රතිසන්ධි චිත්තයටත් මේ භවයේ මනස යම් අරමුණක් නො ගෙන සිටින අවස්ථාවන්හි දී ඇති වන චිත්තයන්ටත් භවාංග චිත්තය ලෙස අභිධර්මයේ ඇතැම් විට යොදා ඇත. එසේ වුවද ඒ සියල්ල එකක්ම යැ යි ගැනීමෙන් පැහැදිලි කිරීම් වලදී ප්‍රශ්න පැන නගී. ඒ නිසා ඒ ඒ තැන්වල දී භවාංග චිත්තය යනුවෙන් යෙදෙන්නේ කුමන අරුතකින් ද යන වග සැලකිල්ලට ගත යුතු ය.

චිත්ත වීථියක භවාංග චිත්තයෙන් පසු ඇති වන්නේ පිළිවෙලින් භවාංග චලන චිත්තය, භවාංග උපච්ඡෙද චිත්තය හා ආවර්ජන චිත්තය යි. හතර වැනියට උපදින ආවර්ජන චිත්තයත් සමග අරමුණ වෙත යොමු වීම ඇරඹේ. මේ නිසා ආවර්ජන චිත්තය ක්‍රියා චිත්තය යනුවෙන් ද හඳුන්වයි. ඊළගට ඇති වන පස් වැනි චිත්තය පහල වන්නේ ඇසේ දෘෂ්ටි විතානය ඇසුරු කරගෙන ය එයට චක්ෂුර් විඥානය යැ යි කියනු ලැබේ. චිත්ත වීථියේ හය, හත, අට යන චිත්තයන් අභිධර්මයේ දක්වා ඇත්තේ සම්පටිච්චන, සන්තිරණ හා වොත්ථපන ලෙසයි. ඇසේ දෘෂ්ටි විතානයෙන් ලද අරමුණ පිළිගැනීමත්, පිළිගත් අරමුණ විමසීමත්, අරමුණ විනිශ්චය කිරීමත් එහි දී සිදු වේ. ඉන් පසු ඇති වන්නේ ජවන චිත්තයන්'ය. සංඛ්‍යාවෙන් එය හතකි. චිත්ත වීථියේ අට වන චිත්තයෙන් විනිශ්චය කරගත් රූපය හොඳින් දැන ගැනීම පිණිස මේ ජවන චිත්ත හත ඇති වේ. 16 හා 17 වන චිත්ත තදාරම්මණ චිත්ත නම් වේ. ජවන

චිත්තයන් ගෙන් දැන ගත් අරමුණ තවදුරටත් ග්‍රහණය කර ගැනීම මේ මගින් සිදු වේ.

(මතකය පිළිබඳ ප්‍රවාදයක් ගොඩ නැගීමේදී ජවන චිත්ත පිළිබඳ පැහැදිලි කිරීම් වැදගත් විය හැක.) පස් වෙනි චිත්තයෙන් පසු චිත්ත වීථියේ ඉතිරි චිත්තයන් පහළ වන්නේ ද හෘද වස්තුව ඇසුරු කරගෙන ය. මේ අයුරින් චිත්ත වීථිය සම්පූර්ණ වීමත් සමග පැන්සල පිළිබඳ දැකීම ඇති වූයේ යැයි අපි සලකමු. නමුත් මෙහිදී සඳහන් කළ යුත්තේ නිරීක්ෂකයාගේ මනස හා ඉන්ද්‍රිය පද්ධතිය 'පැන්සල' නිර්මාණය කර ගත්තේ ඔහුගේ සංස්කෘතියෙන් එය පැන්සලක් ලෙස හඳුනාගෙන තිබූ නිසා ය. වෙනත් සංස්කෘතියක ජීවත් වන අයකුට අපගේ පැන්සල වෙනකක් ය.

මනස යනු ඇති වී පැවතී නැති වී යන චිත්ත, චිත්ත පරම්පරාවක් ලෙස මනසින්ම ග්‍රහණය කර ගැනීමෙන් ඇති වන ප්‍රතිඵලයකි. ඒ අයුරින්ම පැන්සල යනු ද ඇති වී පැවති නැති වී යන ''රූප'' අඛණ්ඩ රූප පරම්පරාවක් ලෙස මනසින් ග්‍රහණය කර ගැනීමෙන් නිර්මාණය වන්නකි.

එක් ''රූපයක් '' ඇති වී පැවතී නැති වීමට ගත වන කාලය චිත්තක්ෂණය 17 කට සමාන වේ. පැන්සල ග්‍රහණයට චිත්තක්ෂණ 17 ක් වැය වූයේ ඒ නිසා ය. එනම් එක් චිත්ත වීථියක් සම්පූර්ණ වීමට සමාන වේ. පංචේන්ද්‍රියයන් ඇසුරු කරගෙන පහල වන චිත්ත වීථියක් චිත්තක්ෂණ 17 ක එකතුවකට සමාන වුවද ඒ ඇසුරු කර නො ගෙන පහළ වන චිත්ත වීථීන් හි චිත්තක්ෂණ සංඛ්‍යාව ඊට වඩා වෙනස් ගණනක් විය හැක. තවද එක් නිරීක්ෂකයකුගේ චිත්තක්ෂණයක් තවත් නිරීක්ෂකයකුගේ චිත්තක්ෂණයකට සමාන නො වේ.

සාමාන්‍ය මිනිසුන් හා තිරිසනුන්ගේ මනස යනු ඇස, දිව, කණ, නාසය, ශරීරය හා හෘද වස්තුව ඇසුරු කර ගෙන පවතින්නකි. මේවා ඇසුරු කරගෙන ඇති වන චිත්ත එක් වූ විට මනස යනුවෙන් හඳුන්වන්න ලැබේ. ඇති වී පැවතී නැති වන චිත්ත, චිත්ත

පරම්පරාවක් ලෙස සැලකීමෙන් මනසක් ඇති ලෙස ග්‍රහණය කර ගන්නේ කුමන ඉන්ද්‍රිය ද ? එය ග්‍රහණය කරගන්නේ ද මනස විසින්ම ය. එනම් මනස විසින් ම මනස නිර්මාණය කර ගනු ලැබේ.

ඇස් දෙකම ඉවත් කළ ද මිනිසකුට ජීවත් විය හැක. ඒ ලෙසම පංචේද්‍රියයන්ගෙන් කුමක් ඉවත් කළ ද ඒ පහම ක්‍රියා විරහිත කළ ද සැලකිය යුතු කාලයක් මිනිසකුට ජීවත් විය හැක. නමුත් හෘද වස්තුව ගැන කිව හැක්කේ කුමක් ද? එය ක්‍රියාකාරී නොවුවහොත් මිනිසකුට ජීවත් විය හැකිද ? අප මිනිසකු මිය යනවා කියන්නේ කුමකට ද ? පැහැදිලිව ම දැන් අපට කිව හැක්කේ හෘද වස්තුව ක්‍රියාකාරී නො වීම සමග එය සිදුවන බවයි. එනම් තව දුරටත් ඒ ඇසුරු කර ගෙන චිත්ත පහළ වීමක් සිදු නොවේ. චිත්තයන් පහළ වීම මේ භවයේ අවසන් වනුයේ හෘද වස්තුව නැති වීම යන කරුණ මත පමණක් පදනම්ව නො වේ. ඒ සඳහා හේතු සාධක බොහෝමයක් තිබිය හැක. එසේ මේ භවයේ අවසානයට පහළ වන චිත්තයට අපි චුති චිත්තය යැයි පවසමු. වෙනත් අයකුගේ හෘදයක් බද්ධ කළ ද හෘදයේ ක්‍රියාකාරිත්වය කෘත්‍රිම යන්ත්‍රයකට භාර දුන්න ද අපේ පැහැදිලි කිරීමේ වෙනසක් සිදු නො වේ. අප කතා කළේ හෘද වස්තුව ගැන මිසක හෘදය ගැන නොවන බව එහිදී සිහිපත් කළ යුතු ය.

නමුත් සිංහල බෞද්ධයන් ලෙස අපි කිසිසේත්ම ඌනිතවාදීන් නොවිය යුත්තෙමු. එනම් හෘද වස්තුව ක්‍රියාකාරී නොවීමත් සමඟ මිය යනවා යන්නෙන් අදහස් වන්නේ ජීවය ඇත්තේ එහි වැන්නක් නො වේ. මිනිසකු හෝ තිරිසනකු මේ භවයේ මිය යැම හුදු හෘදයේ ක්‍රියාකාරීත්වය නැවතීම පමණක් නො වේ. තේරුම් ගත යුත්තේ මිනිසුන්, තිරිසනුන් වැනි මනස එතරම් නො දියුණු සතුන්ගේ මේ භවයේ අවසානයට ඇති වන චිත්තය හෘද වස්තුව ඇසුරු කර ගෙන ඇති වනවා යන්න පමණි. බඹුන්ගේ චුති චිත්ත ඇති වීමට හෘද වස්තුවක් අවශ්‍ය නො වේ.

අපේ ප්‍රවාදය තුළ මොළයට හා ස්නායු පද්ධතියට හිමි ස්ථානය පිළිබඳ ව ද සඳහන් කළ යුතු ය. සිරුරක් ඇති අනෙක් සියළු ම සතුන්ට වඩා මිනිසුන්ගේ මොළය වැඩි වර්ධනය වී ඇත.

එහි කිසිදු තර්කයක් නැත. අවයවයක් ලෙස සැලකූ විට මොළයට ඉහළ ම ස්ථානයක් හිමි වේ. නමුත් බටහිර විද්‍යාඥයන් හඳුන්වන පරිදි එය මතකය ගබඩා කර ගෙන ඇති සිතුවිලි උපදින තැන නොවේ. ඇතැම් විට මනස ඇත්තේ මොළයේ පිහිටි 'ලිම්බික් පද්ධතිය' තුළ බව ද ඔවුහු පවසති. මතකය ගබඩා වී ඇත්තේ මොළයේ ය, සිතිවිලි උපදින්නේ මොළයේ ය හා මනස ඇත්තේ මොළයේ ය යන්න වැරදි ප්‍රකාශයකි. මොළය යනු මේවාට උපකාරී වන ආධාරක අවයවයක් පමණි. තවද මොළය යනු අවයවයක් මිස ඉන්ද්‍රියයක් නො වේ. හෘදය ඇතුළු සිරුරේ සියළු ම අවයවයන්ගේ මනා ක්‍රියාකාරීත්වය උදෙසා මොළය අවශ්‍ය ය. මොළය හා ස්නායු පද්ධතිය අන්තරාසර්ගික ග්‍රන්ථීන් ද සමඟ එක්ව සියළු ම අවයවයන්ගේ ප්‍රශස්ත ක්‍රියාකාරීත්වය පවත්වා ගනී.

ඔබ මේ ලිපිය කියවමින් සිටින අතර තුර අසලින් දැවැන්ත නාග රාජයකු ඇදී යනවා හදිසියේ දුටුවා යැ යි සිතන්න. ඒ සමගම හෘද ස්පන්දන වේගය වැඩි වීම අපට අපේක්ෂා කළ හැකි දෙයකි. බටහිර භෞතවේදයට අනුව එය සිදු වන්නේ ඇසේ දෘෂ්ටි විතානය මත නයාගේ ප්‍රතිබිම්භය වැටී එය දෘෂ්ටි ස්නායුව මගින් මොළයේ දෘෂ්ටියට අදාළ ප්‍රදේශයට වෙත ගෙන යාමෙන් පසු නයා හඳුනාගෙන අදාළ පණිවිඩය හෘදයට ලබා දීමේ ප්‍රතිඵලයක් ලෙස ය. හෘදයට පළමුව පණිවිඩය අනුවේගී ස්නායු පද්ධතියෙනුත් පසුව හෝමෝන මගිනුත් ලැබේ යැ යි එහි දී සැලකේ.

නමුත් අපේ ප්‍රවාදයට අනුව මොළය, දාෂ්ටික ස්නායුව ද ඇතුළුව ඇස හොඳින් ක්‍රියා කරයි නම් ඇස ආශ්‍රිත ව ම නයා පිළිබඳ ව චිත්තය පහළ වීම සිදු වේ. චිත්ත පරම්පරාවේ ඊළඟ චිත්තයන් හෘද වස්තුව ආශ්‍රිත ව පහළ වන සේ සැලකිය හැකි අතර ඒ සමඟ ම හෘද වස්තුවේ ක්‍රියාකාරිත්වය ද වෙනස් වේ. මනසට හෘද වස්තුවේ ක්‍රියාකාරිත්වයට බලපෑමක් කළ හැක. හෘද වස්තුවේ ක්‍රියාකාරීත්වය වෙනස් වීමත් සමඟම හෘදය නම් අවයවයේ ක්‍රියාකාරීත්වය ද වෙනස් වේ. එසේ වීමට නම් එම හෘදය සාමාන්‍ය පරිදි රුධිර සැපයුම හා ස්නායු සැපයුම ලබන්නක් විය යුතු ය. එසේ හෘද ස්පන්දන වේගය වැඩි කර පවත්වා ගෙන යෑමට ස්නායු පද්ධතිය හා අන්තරාසර්ගික

ග්‍රන්ථී ත් උපකාරි වන බව සැලකිය හැක. මේ අදහස් තවත් දියුණු කර ගැනීම මගින් අධි රුධිර පීඩනය, තරංගකාරී ජීවන රටාව, භාවනාව, සංගීතය ආදිය අතර සම්බන්ධතාවක් අපට වැඩි අපහසුවකින් තොර ව ගොඩ නගා ගත හැකි වනු ඇත. මොළය පිළිබඳ ඉහත පැහැදිලි කිරීම් අනුව මොළය අක්‍රීය එහෙත් හෘදය ක්‍රියා කරන රෝගියෙකුගේ ඇස කණ නාසය දිව ශරීරය ආශ්‍රිත ව චිත්තයන් පහල නො වුව ද හෘද වස්තුව ආශ්‍රිත ව මූලික චිත්තයන් පහළ වීමක් සිදු වේ. එනම් ඔහු හෝ ඇය තව දුරටත් ජීවත් වන අයකු / අයක ලෙස සැලකීමට අපේ විද්‍යාව තුළ හැකියාව තිබේ. මළ මිනිසකුගේ කුමන හෝ ආකාරයෙන් නැවතත් රුධිර සංසරණයක් ඇති කළ හොත් ඊට පණ ලැබේ යැයි වැරදියට ගත යුතු නැත. හෘද වස්තුව ඇසුරු කරගෙන වුව ද චිත්ත ඇති වීමට තවත් බොහෝ සාධක බලපායි.

අවසන් වශයෙන් සාරාංශයක් ලෙස ඉදිරිපත් කරන්නේ නම් මේ ලිපිය මගින් උත්සාහ කළේ මනස යනු කුමක් ද ? එය කුමක් ඇසුරු කර ගෙන පවතී ද ? යන ප්‍රශ්නයට සිංහල බෞද්ධ පදනමක සිට විවරණයක් ලබා දීමටයි. මෙය භෞතිකවාදී හෝ විඥානවාදී පැහැදිලි කිරීමක් නො වේ. සැබැවින් ම අප කතා කරන්නේ ඇති මනසක් ගැන නො වේ. අනිත්‍ය දුක්ඛ අනාත්ම පිළිබඳ ව ඇති අනවබෝධය නිසා නිර්මාණය කරගත් නැති මනසක් පිළිබඳ ව යි. මෙහි දී චිත්ත ආශ්‍රිත ව පැහැදිලි කිරීම සිදු වුව ද ඒ නමින් මනසින් තොර ව යමක් නැත. චිත්ත යනු අරූපාවචර දෙයකි. අපේ ප්‍රවාදයට අනුව මනසට කිසිදු ආකාරයක ද්‍රව්‍යමය හෝ විද්‍යුත් චුම්බක තරංගමය ගුණ නැත. එය ඇස, කණ, නාසය දිව ශරීරය යන අවයවයන් හා හෘද වස්තුව ඇසුරු කොට ගෙන පවතී. හෘද වස්තුව යනු හෘදය තුළින් රුධිරය සංසරණය වීම නිසා නිර්මාණය වන්නකි. එය හෘදය නම් අවයවය හෝ රුධිරය නොවේ. යම් මොහොතකදී ක්‍රියාකාරී හෘදය තුළ ඇති රුධිරය හා එම පැහැදිලි කිරීම බැඳේ.

ජීවත් වන මිනිසකුගේ හෘදයේ ස්ථිර ව පවතින ලෙයක් නැත. රුධිර සංසරණය නිසා එය ක්ෂණයයක් පාසා වෙනස් වේ. ක්‍රියා සාධක සිත්, සියළු ප්‍රධාන සිත් හා මූල චිත්තය උපදින්නේ හෘද

වස්තුව ඇසුරු කරගෙනය. නමුත් හෘද වස්තුව යනු චිත්තය ඇති වීමට මූල හේතුව නො වේ.

ඒ හැරුණු විට ඇස කණ නාසය දිව ශරීරය ඇසුරු කරගෙන ද සිත් උපදී. එසේ වීමට නම් එම අවයවයන් මනාව ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා මොළය ඇතුළු ස්නායු පද්ධතියේ ක්‍රියාකාරිත්වය අත්‍යාවශ්‍ය ය. මිනිසුන්ගේ සහ තිරිසනුන්ගේ චිත්ත මේ ස්ථාන ඇසුරු කර ගෙන ඇති වනවා යැයි පැවසුව ද ඉන් අදහස් වන්නේ චිත්ත සිරුර තුළ පවතින යමක් බව නො වේ. මනස ඇත්තේ හෘද වස්තුවේ කියා කිසිසේත් වැරදියට අවබෝධ කර ගත යුතු නැත. මේ සියළු චිත්තයන්ගේ එකතුවෙන් මනස නිර්මාණය වේ. එක් චිත්තයක් නැති වන්නේ තවත් චිත්තයක් ඇති කරමිනි. ඒ අතර පරතරයක් නැත. චිත්ත දෙකක් හෝ වැඩි ගණන් එකවර ඇති නො වේ. එනම් වරකට එකකි. මෙසේ චිත්ත පරම්පරාවේ එකතුවෙන් මනසක් ඇති වන බව ගන්නේ ද මනස මගින් ම ය. සාමාන්‍ය මිනිසුන්ගේ හා තිරිසනුන්ගේ මනස ඇස, කණ, නාසය, දිව, ශරීරය හා හෘද වස්තුව ඇසුරු කර ගෙන පැවතිය ද දෙවියන් බඹුන් වැනි සතුන්ගේ මනසේ පැවැත්මට එසේ අවශ්‍ය නැත. මිනිසුන්ට වුව ද මනස දියුණු කිරීම මගින් මේවා ඇසුරු කර නොගෙන චිත්ත පහළ කර ගත හැකි අවස්ථාවන්ට එළැඹිය හැක. අභිඥා යනුවෙන් හඳුන්වන්නේ එවැනි අවස්ථාවන් බව සැලකිය හැක.

දුක, සතුට, ආදරය නැගෙනුයේ හදවතින් බව කවීහු බොහෝ විට පවසති. ඔවුන් එසේ පවසන්නේ අවිඥාණික ව මිස හෘද වස්තුව ගැන සිංහල බෞද්ධ විවරණය දැන ගෙන යැයි අපට අපේක්ෂා කළ නොහැක. මෙවැනි යෙදුම් ගැන අධ්‍යයනයක් ද  කළ හැකි නම් එය ද ඉතා වැදගත් විය හැක.

මේ ප්‍රවාදය ඔස්සේ ඉදිරියට යෑමෙන් මතකය, මතකය ආවර්ජනය කිරීම, පෙර භවයක පුරුදු මේ භවයට බලපාන අයුරු වැනි කරුණු පිළිබඳ ව නව ප්‍රවාද ගොඩ නගා ගැනීමට අපට හැකියාවක් ලැබෙනු ඇත. ඒ අයුරින් ම ජීවීන් හා සතුන් පිළිබඳ

අපේ වර්ගීකරණයක් ද ඉදිරිපත් කිරීමට මග පෑදෙනු ඇත. මෙහි දැක්වෙනුයේ පෘථග්ජනයන්ට මනස ගැන යම් කිසි අවබෝධයක් ලබා ගැනීම පහසු කරවීම සඳහා නිර්මාණය කළ ප්‍රවාදයකි. එය ගොඩ නැගී ඇත්තේ සිංහල බෞද්ධ චින්තනය මත ය. ප්‍රවාද යනු වෙනස් නොවන්නක් නොවේ. ඒවාද කලින් කලට වෙනස් වේ. අනාගතයේ දී මීට වඩා හොඳින් මනස හා එහි ක්‍රියාකාරිත්වය තේරුම් කළ හැකි ප්‍රවාද ගොඩ නැගීමට ඇති බාධාවක් නැත. නමුත් ඒ ප්‍රවාදය අපට වැදගත් වනුයේ එය සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ නිර්මාණය වන්නක් නම් හා එමගින් අවසාන වශයෙන් සසර ගමන කෙටි කර ගැනීමට යම් අනුබලයක් ලබා දෙන්නේ නම් පමණි.

## ආශ්‍රිත මූලාශ්‍ර ග්‍රන්ථ නාමාවලිය


1. අභිධර්ම පිටකය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005.
2. ආනන්ද මෛත්‍රී හිමි; බලන්ගොඩ: සතර පරමාර්ථය, බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, මහනුවර, 1973.
3. ආනන්ද හිමි; කෝන්ගස්තැන්නේ: අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1999.
4. කරුණාදාස වයි: ඉන්ද්‍රියවිඥෙය ලෝකය පිළිබඳ ආභිධර්මික විවරණ, සම්භාෂා 10 කළාපය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, 1999.
5. චන්ද්‍රවිමල හිමි; රේරුකානේ: අභිධර්මයේ මූලික කරුණු, ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, පොකුණුවිට, 1999 (අටවන මුද්‍රණය).
6. චන්ද්‍රවිමල හිමි;රේරුකානේ: පටිච්ච සමුප්පාද විවරණය,හයවැනි මුද්‍රණය, ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, පොකුණුවිට, 1991(හයවැනි මුද්‍රණය)
7. චරක සංහිතාව ප්‍රථම භාගය: රජයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව, 1991.
8. ද සිල්වා නලින්: මගේ ලෝකය, තුන්වන සංස්කරණය, චින්තන පර්ෂද ප්‍රකාශන, මහරගම, 1999 (තුන්වන සංස්කරණය)

9. සිරිසෝමිස්සර හිමි මාපලගම: බෞද්ධ ධර්ම සංග්‍රහය, සමයවර්ධන, කොළඹ 10, 1990.
10. Bodhi Bhikku : A comprehensive Manual of Abhidhamma, , Buddhist Publication Society, Kandy, 1999 (2nd Edition).
11. Kumar P, Cleark M: Clinical Medicine; Elsevier Limited, 2005.(6th Edition)
12. Larsen W J: Human Embryology, Churchill Livingstone, 1997. (2nd Edition)
13. Misulis K E: Essentials of Clinical Neurophysiology, 2nd Edition, Butterworth Heinemann, 1997.
14. Sadler T W: Medical Embryology, Lippincott Williams & Wilkins, 2004.(9th Edition)
15. Sims A : Symptoms in the Mind, W.B. Saunder Company Ltd, 1995.(2nd Edition)
16. Thorburn ;G D, Harding R: Text book of fetal physiology, Oxford University Press, 1994.
17. Yudofsky ;S C, Hales E R: Synopsis of Neuropsychiatry, American Psychiatric Press, 1994. (2nd Edition)

<u>මූලාශ්‍ර පුවත් පත් ලිපි</u>

1. ද සිල්වා නලින්: පණ නැති බටහිර ජීව විද්‍යාව, විදුසර, උපාලි පුවත් පත් සමාගම, කොළඹ 13, 2003.05.21.
2. ද සිල්වා නලින්: බටහිර විද්‍යා ආධිපත්‍යය, විදුසර, උපාලි පුවත් පත් සමාගම, කොළඹ 13, 2003.03.26.
3. ද සිල්වා නලින්: මනස හා ද්‍රව්‍යය, විදුසර, උපාලි පුවත් පත් සමාගම, කොළඹ 13, 2004.02.25.
4. ද සිල්වා නලින්: මනසේ පැවැත්ම, විදුසර, උපාලි පුවත් පත් සමාගම, කොළඹ 13, 2005.09.14.
5. ද සිල්වා නලින්: වෙනස් වීම වෙනස් කිරීම, විදුසර, උපාලි පුවත් පත් සමාගම, කොළඹ 13, 2004.06.09.
6. ද සිල්වා නලින්: සිංහල බෞද්ධ මනස, ඉරිදා දිවයින, උපාලි පුවත් පත් සමාගම, කොළඹ 13, 2002.10.20.